# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1563/ 2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2023 திகதி

දිනය / Date — 13/12/2023 පැය 1050

## මාධ්‍ය නිවේදනය

**01. කොකේන් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුෂ්පාරාම උප කඳවුර.**

2023.12.12 වන දින දහවල් කාලයේ මිදිගම පොලිස් වසමේ පාතේගම ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා පුෂ්පාරාම උප කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **කොකේන් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 880 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** ජංගම දුරකතනයක් හා යතුරුපැදියක් සමඟ අත්අඩංගුවට ගෙන මිදිගම පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වන වැලිගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. මිදිගම පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පැලියගොඩ පොලිස් ස්ථානය.**

2023.12.12 වන දින රාත්‍රී කාලයේ දී පැලියගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත පැලියගොඩ පොලිස් වසමේ පාරාක්‍රම මාවත ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 13 ක් සන්තකයේ තබාගෙන සිටි** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු අවුරුදු 23 ක් වන පර්ගියුෂන් පාර, කොළඹ 14 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.පැලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

**03. මාරක රිය අනතුරක් - කැස්බෑව පොලිස් වසම.**

2023.12.12 වන දින රාත්‍රී කාලයේ කැස්බෑව පොලිස් වසමේ කැස්බෑව හොරණ මාර්ගයේ හල්පිට ප්‍රදේශයේදී කැස්බෑව දෙස සිට හොරණ දෙසට ධාවනය වූ වෑන් රථයක් මාර්ගය හරහා ගමන් කල පදිකයකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ පදිකයා වෑන් රථ රියදුරු විසින්ම වැතර රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 47ක් වූ අටුලුගම, දෙහිඕවිට ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය වැතර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. වෑන් රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර කැස්බෑව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**